සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය(සැකසුම - ඩබ් චන්ද්‍රිකා සමරසිංහ)

10 සතිය 11 පාඩම - උගන්නැ සිය බස

මත් වන්නැ එහි රසයෙන් (වාක්‍ය රීති)

1)සදුසු උක්ත පද වරහන් තුළින් තෝරන්න

*.............දරුවන්ට ඔවදන් දුන්හ. (පියාණන්/පියාණෝ) *............දෙගුරුන් නමදිති. (මළණුවෝ/මළණුවන්)

*..........රූපවාහිනිය නරඹති. (දුවණියන්/දුවණියෝ) *.......... ආහාර පිළියෙල කරති.(මෑණියෝ/මෑණියන්)

*............... සම්පත් රැස් කරති. ( සිටාණෝ/සිටාණන්)

2)සුදුසු ආඛ්‍යාත පද යොදන්න

1.බුදු රජාණන් වහන්සේ අභිධර්මය දේශනා .........(කළේ ය/කළහ)2.දෝණියන් දෑ අකුරට ......... ( යන දෑය / යයි )

3.භික්ෂූන් වහන්සේ පිඬු සිඟා ................. (වඩින සේක / වඩියි ) 4.ස්වාමීන් වහන්සේ බණ..........(දෙසයි/දෙසති)

3)මෙම වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න

*මුව රැළ වතුර කඩිති සොයා යයි. *දරු කැල ශිල්ප හැදෑරුවේ ය. *තරු කැල බබළති. *ළමා පෙළ සුවෙන් පසු වෙයි. *ගව රැළ තණ බිස්සේ ලගියි.

4)මෙම නිත්‍ය බහු වචන පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

*අයෙක් *ඇතමෙක් *අතැම්හු *අය * කවරහු * සමහරෙක් * කෙනෙක් * දෙනෙක් * සමහරු * දෙන

5)සුදුසු පද යොදා හිස් තැන් පුරවන්න

1. ............... මාර්ග නීති කඩ කරති. (සමහරු/සමහරුන්)
2. ............... සතුන්ට කරුණාව පාති. (බොහෝ දෙන/බොහෝ දෙනා)
3. ................ ගී ගයයි. ( එක් අයෙක්/ අයෙක්)
4. ................ මේ සිද්ධිය දුටුවෝ ද? ( කවරහු/කවුරුන්)
5. ................ දුරස්ත අධ්‍යාපනයේ නිසි ඵල නෙළා ගනිති. ( සමහරු/සමහරුන්)

6)"දෙස බස රැස රැක ගනිමු" මැයෙන් රචනයක් ලියන්න